00070

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව

උපාධි වැඩසටහන- 3වන මට්ටම 2020/2021

අවසාන පරීක්ෂණය

**EPU3235 - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්**

කාලය - පැය දෙකයි. **(02)**

---

දිනය - **2023.01.21** වේලාව - පෙ.ව.**09.30** - ප.ව.**11.30** දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද,2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

**I වන කොටස**

01. 'පරිසරය' යන්න ඔබ අදහස් කරන්නේ කුමක් ද? අදාළ උදාහරණ දෙමින් සාකච්ඡා කරන්න.

02. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය අනෙකුත් විෂයයන්ගෙන් වෙනස් වන්නේ කෙසේ ද? කෙටියෙන් විස්තර කරන්න.

03. 'සන්නිවේදනය' ඔබ අදහස් කරන්නේ කුමක් ද?

04. ප්‍රාථමික පන්තිවල පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් (ERA) තක්සේරු කිරීමේ වැදගත්කම සඳහන් කරන්න.

05. පරිසරය සුරැකීමේ දී පාසලේ කාර්යභාරය කෙටියෙන් විස්තර කරන්න.

06. පහත සඳහන් පද පැහැදිලි කරන්න.

    i. ජීවී ii. අජීවී

07. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ ඉතිහාසය හැරවුම් ලක්ෂ්‍යය වැදගත් අවධීන් සහ විෂයමාලාවේ වර්ධනය කෙටියෙන් පැහැදිලි කරන්න.

08. සන්නිවේදනය සහ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ අන්තර් සම්බන්ධතාව සමාලෝචනය කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. "මාස කිහිපයකට පෙර ශ්‍රී ලංකාවේ වායු දූෂණයේ පෙර නොවූ විරූ වැඩිවීමක් ඉන්දියන් අර්ධද්වීප ප්‍රදේශයෙන් හමන දූෂිත වායු මට්ටම නිසා බවට දෝෂාරෝපණය කෙරේ."

(i) ගෝලීය පරිසරය ගැටළු **හතරක් (04)** ලැයිස්තු ගත කර පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) පරිසරය සුරැකීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. (i) පහත සඳහන් වසරවල පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයේ සංවර්ධනය වූයේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

a) 1985 b) 1993 c) 1997 (ලකුණු 10)

(ii) ප්‍රාථමික මට්ටමේ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ අපේක්ෂිත නිපුණතා **හතරක් (04)** ලැයිස්තු ගත කරන්න.
ළමුන් සඳහා එම නිපුණතා ක්‍රියාකාරකම් තුළින් ක්‍රමානුකූල ව සංවර්ධනය වන්නේ කෙසේ ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. (i) පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් හා සම්බන්ධ සන්නිවේදන නිපුණතාවන් පිළිබඳ මූලික සංකල්ප සඳහන් කරන්න. (ලකුණු 08)

(ii) සිසුන් තුළ සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම සඳහා භාවිත කළ හැකි එක් ක්‍රියාකාරකමක් විස්තරාත්මක ව ලියන්න. (ලකුණු 12)

12. (i) "ප්‍රාථමික අවධියේ සියලුම විෂයයන් සඳහා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී තක්සේරු කිරීම හා ඇගයීම ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි."
ඉහත ප්‍රකාශය සමග ඔබ එකඟ ද? ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න.
(ලකුණු 10)

(ii) i. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් තක්සේරු කිරීමේ දී සහ ඇගයීමේ දී සලකා බැලිය යුතු වැදගත් අංග **හතරක් (04)** ලැයිස්තු ගත කරන්න. (ලකුණු 02)

ii. අදාළ උදාහරණ සමග එම අංග පැහැදිලි කරන්න. (ලකුණු **08**)

13. (i) පරිසරය සුරැකීමේ දී පාසලේ කාර්යභාරය විස්තර කරන්න. (ලකුණු 05)

(ii) බාහිර ලෝකයේ පරිසරය පිළිබඳ ව අත්දැකීම් ලබා ගැනීමට විවිධ අවස්ථා තිබේ. එම අවස්ථා ප්‍රධාන ධාරාවන් තුනකට වර්ගීකරණය කළ හැකි ය.

i. එම ප්‍රධාන ධාරාවන් **තුන (03)** ලැයිස්තුගත කරන්න. (ලකුණු 06)

ii. පරිසරය ආශ්‍රිත ශ්‍රම වෙළඳපොලේ ඇති අවස්ථා මොනවා ද? (ලකුණු 09)

හිමිකම් ඇවිරිණි.